**මොනරාගල ප්‍රාදේශීය සභාව - 2021**

**------------------------------------------**

## 1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 1.1 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මොනරාගල ප්‍රාදේශීය සභාවේ 2021දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය,එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය,මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මොනරාගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහපොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්</u>

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේමූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාව, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රාදේශීය සභාවට අයත් ගොඩනැගිලි 10 ක වටිනාකම ද්වි ගණනයවීගිණුම්ගත. වී වී තිබීම නිසා වටිනාකම රු. 44,631,460 කින් ඉඩම් හා ගොඩනැගිලි සහ ප්‍රාග්ධන ගිණුමට ආදායමින් දායකවීම යන ගිණුම් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේ දී ගිණුම් සකස් කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | වත්කම්වල වටිනාකම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගතකළ යුතුය. |
| (ආ)සමාලෝචිත වර්ෂයේ දී ප්‍රාදේශීය සභාව විසින් ඉදිකර තිබුණු ගොඩනැගිලි 08 ක වටිනාකම ප්‍රාග්ධනිත නොකිරීම නිසා ඉඩම් හා ගොඩනැගිලි ගිණුමේ ශේෂය හා ප්‍රාග්ධන ගිණුමට ආදායමින් දායකය ගිණුම රු. 8,080,046 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිකිරීම්වලට අදාල ගෙවීම් අදාල වර්ෂය තුල කිරීමට නොහැකිවීම නිසා ගිණුම් ගතකිරීමට අතපසු වූ බවත් එම අඩුපාඩු ඉදිරි මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී නිවැරදි කරන බවත් දන්වා ඇත. | සභාවට අයත් සියලු ඉඩම් හා ගොඩනැගිලි දේපල පිරියත උපකරණ යටතේ ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ)ඉඩම් හා ගොඩනැගිලි යටතේ දක්වා තිබෙන රු. 915,200 ක් වූ ගොඩනැගිලි අබලන්වීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් කඩා ඉවත්කර තිබුණු නමුත් එම වටිනාකම් ගිණුමෙන් ඉවත්කර නොතිබීමෙන් | අතපසුවීමකින් එම ශේෂ ගිණුමෙන් ඉවත් කිරීමට නොහැකි වූ බවත් ඉදිරියේ දී නිවැරදි කර ගැනීමට පියවර ගන්නා බවත් දන්වා ඇත. | කඩා ඉවත් කරන ලද ගොඩනැගිලි වල වටිනාකම දේපල පිරියත හා උපකරණ සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුම්වලින් ඉවත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| එම ප්‍රමාණයෙන් ගොඩනැගිලි වටිනාකම වැඩියෙන් දක්වා තිබුණි. | | |
| (ඇ)සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දේපල පිරියත හා උපකරණ සහ ප්‍රාග්ධන යෙදුමට ආදායම් දායකය යන ගිණුම්වල ශේෂ අතර රු. 123,832 ක වෙනසක් නිරීක්ෂණය වූ නමුත් එම වෙනසට හේතුව විගණනය වෙත ඉදිරිපත් නොවුණි | 2013 වර්ෂයේ සිට පැවත එන හඳුනානොගත් වෙනස ඉදිරියේ දී නිවැරදි කරන බව දන්වා ඇත. | දේපල පිරියත උපකරණ මිලදී ගත් අවස්ථාවේදී සම්පූර්ණයෙන් ක්ෂය වූ බ ව සලකා මුළු වටිනාකම ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකය ගිණුමට බැර කරන බැවින් එම ගිණුම් දෙකෙහි ශේෂයන් සමාන විය යුතුය. |
| (ඉ) සමාලෝචිත වර්ෂයේ ට්‍රැක්ටර් රථය අලුත්වැඩියා කිරීමේ වියදම වූ රු. 390,590 ක් ගිණුම්ගතකර නොතිබීමෙන් අතිරික්තය හා ජංගම වගකීම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේ ගිණුම් සැකසීමේදී නිවැරදි කරන බව දන්වා ඇත. | වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගතකළ යුතුය. |
| (ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන ගිණුම් 03 කට අදාලව කිසිදු තොරතුරක් සභාව සතුවී නොතිබීම නිසා අයවිය යුතු රු. 689,214 ක වටිනාකම ව්‍යාජ වත්කම්මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි. | ජල ගාස්තු අයවිය යුතු පාර්ශවයන් සොයා ගැනීමට විවිධ ක්‍රියාමාර්ග ගන්නා ලද බව දන්වා ඇත. | ජංගම වත්කම් ලෙස දක්වා ඇති අයවිය යුතු ජල ගාස්තු අයවිය යුතු පාර්ශවයන් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 64,410,417 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූආදායම රු. 18,842,362 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණපහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයට අදාලව රු. 7,161,506 ක් සහ ඉකුත් වර්ෂයන්ට අදාලව රු. 11,621,282 ක හිඟ වරිපනම් බදු අයකරගෙන නොතිබුණි. | 2021 වර්ෂය ආරම්භයේ සිට පැවති කොරෝනා වසංගත තත්ත්වය නිසා වරිපනම් බදු අයකිරීම් ප්‍රමාද වූ බව දන්වා ඇත. | හිඟ වරිපනම් බදු අය කර ගත යුතුය. |
| (ආ) 2010 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා සහා දේපල 11 ක් බදුදීමෙන් අයවිය යුතු හිඟ බදු මුදල රු.11,740,750 ක් අයකරගෙන නොතිබුණි. | 2021 වර්ෂය ආරම්භයේ සිට පැවති කොරෝනා වසංගත තත්ත්වය නිසා බදු අයකිරීම් ප්‍රමාද වූ බව දන්වා ඇත. | හිඟ බදු කඩිනමින් අයකර ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**දෘශ්‍ය අක්‍රමිකතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොවිඩ් 19 වසංගත සමයේ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ජනතාවට ලබාදීම සඳහා 2020 අප්‍රේල් 11 දින ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරුන් තිදෙනෙකු වෙත නැවත පියවීමේ පදනම මත ලබාදී තිබුණු රු. 475,000 ක අත්තිකාරම් මුදල් වසරකට වැඩි කාලයක් ගත වී තිබුණද පියවා නොතිබුණි. | එළඹෙන මහ සභා වාරයට පෙර මෙම මුදල් පියවා ගන්නා බව දන්වා ඇත. | පියවිය යුතු අත්තිකාරම් මුදල පියවාගත යුතුය. |